## තලවාකැලේ - ලිදුල නගර සභාව.
## නුවරඑළිය දිස්ත්‍රික්කය.

### 1. මූල්‍ය ප්‍රකාශන.

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 28 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 පෙබරවාරි 28 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 අප්‍රේල් 26 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

#### 1.2 මතය.

සභාපතවරයා වෙත, යවන ලද වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති තලවාකැලේ - ලිදුල නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

##### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බිල්කල යුතු තානායම් කුලී රු. 6,856,972 ක් ගිණුම්ගත කර නොතිබුණි.

##### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 523,663 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

#### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,232,667 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,695,583ක් විය.

#### 2.2 ආදායම් පරිපාලනය.

##### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය. | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය. |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i). | වරිපනම් හා බදු | 3,605 | 2,026 | 2,815 |
| (ii). | බදු කුලී | 2,482 | 2,860 | 563 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 1,454 | 754 | - |
| (iv). | වෙනත් ආදායම් | 1,761 | 777 | 1,931 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ පධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,603,237 |
| (ii) | මුද්දර ගාස්තු | 240,000 |

2.2.3 තානායම් ගාස්තු.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යතුව තිබූ රු.6,856,972 ක තානායම් ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

2.3 අවිධිමත් ගනුදෙනු.

(අ). නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 159 (1) ඊ වගන්තියේ විධිවිධාන වලට පටහැනිව විෂය භාර ඇමතිවරයාගේ අනුමැතියකින් තොරව නව සභාපතිවරයා පිළිගැනීමේ උත්සවය සඳහා රු.20,159 ක් වැයකර තිබුණි.

(ආ). මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ 48 (1) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව සභාව විසින් ප්‍රධාන ලේකම් වරයාගේ හා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියක් ලබා නොගෙන සේවකයින් 17 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුල රු.1,723,488 ක් වැටුප් ගෙවා තිබුණි.

2.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.

ආයුර්වේද වෛද්‍ය නිල නිවාසය සහ සංස්කෘතික ශාලාව නිශ්කාර්යව හා ඌණ උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදි නිරීක්ෂණය විය.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

(අ). සභාව සතු ලිදුල ප්‍රදේශයේ පිහිටි සුසාන භූමිය බාහිර පුද්ගලයන් හා ආයතන විසින් අනවසරයෙන් භාවිතයට ගෙන තිබුණි. එහි අයිතිය තහවුරු කර ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණ.

(ආ). 2007 වර්ෂයේදී පරිත්‍යාගයක් වශයෙන් සභාවට ලැබී තිබූ වටිනාකම රු. 1,500,000 ක් වන ගිණි නිවන රථය හා ගිණි නිවීමේ උපකරණ 06 ක් ගිනි නිවීමේ පුහුණු සේවකයන් නොමැතිවීම හේතුවෙන් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා භූමියේ රඳවා තිබුණි.

2.6 කාර්ය සාධනය.

(අ). වාර්ෂික ක්‍රියාකාර සැලැස්මට අනුකූලවීම් තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය හා භෞතික කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා හා පාලන වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයෙ ප්‍රාග්ධන වියදම් ඇතුලත් කර නොතිබුණ.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද.

කොන්ත්‍රාත්කරුවන් වැඩ ප්‍රමාද කිරීම හෙතුවෙන් ව්‍යාපෘති 13 ක් ක්‍රියාතමක කිරීමේ දිර්ඝ ප්‍රමාදයක් දක්නට ලැබුණි.